www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# හදිසි මැතිවරනයක් සදහා බ්‍රිතාන්‍ය අගමැති බ්‍රවුන්ගේ සූදානම, වැඩෙන අර්බුදයේ සලකුනකි

## British Prime Minister Brown prepares for snap general election: A sign of mounting crisis

**ක්‍රිස් මාස්ඩන් හා ජුලි හයිලන්ඩ් විසිනි**
**2007 ඔක්තෝබර් 05.**

ඉරාකය තුල එක්සත් රාජධානියේ හමුදාවන් වෙත හිටි අඩියේ සිදු වූ ගෝර්ඩන් බ්‍රවුන්ගේ සංචාරය, නොවැම්බරයේ දී හදිසි මහා මැතිවරනයක් සඳහා ඔහුගේ කැඳවුම බොහෝදුරට නිශ්චිත බව කියාපායි.

නත්තල් සමය වන විට බස්රාවෙන් තවත් 500ක හමුදාවක් ඉවත් කර ගැනීමේ සැලැස්ම නිවේදනය කිරීම සඳහා බ්‍රිතාන්‍ය අගමැති සොල්දාදුවන් සමග ඡායාරූපයකට පෙනී සිටි අවස්ථාව යොදා ගත්තේය. ඔක්තෝබර් 8 වැනි දින පාර්ලිමේන්තුව යලි රැස් වන විට ඉරාකය පිලිබඳව බ්‍රවුන් විසින් ප්‍රකාශයක් කිරීමට දැනටමත් නියමිත ව ඇත.

ඊට පූර්වයෙන් ම ඔහුගේ ප්‍රකාශය විකාශනය කිරීම අමු අමුවේම ඡන්ද ව්‍යාපාරයේ යෙදීමකි. කොන්සවේටිව් පක්ෂ සමුලුව එලඹෙමින් තිබෙන අතර තුර, සිදු වන අගමැතිගේ සංචාරය, ලේබර් පක්ෂයේ ඡන්ද පදනමට වල කැපීම සඳහා බොහෝ දේ සිදු කර තිබෙන ඉරාක මරාලයෙන් ඔහුගේ ආන්ඩුව ඈත් කර ගැනීමට දැරූ තවත් ප්‍රයත්නයකි.

බ්‍රවුන් විසින් ලබන සතිය පටන් ගැනීමේදී ම පූර්ව අයවැය වාර්තාව හා පරිපූර්න වියදම් සමාලෝචනය ද ඇතුලත් ප්‍රධාන ප්‍රකාශන ඉදිරිපත් කිරීම සඳහා සූදානම් කර ඇත. සෞඛ්‍ය හා අධ්‍යාපනය සඳහා අතිරේක මුදල් ද ව්‍යාපාර සඳහා තවත් බදු සහන ද, ජාතික සෞඛ්‍ය සේවය පිලිබඳ අන්තර් සමාලෝචනයක් ද ගෙන ඒමේ සැලසුම්, මහ සෝෂාවක් බවට පත්කර ගැනීමට ඔහු බලාපොරොත්තු වෙයි.

මාධ්‍ය සමපේක්ෂනය කරන්නේ බ්‍රවුන්, ඔක්තොබර් 9 වැනි අඟහරුවාදා රැජින මුනගැසී පසු දින පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට හා මැතිවරන සති කිහිපයකින් පසුව නොවැම්බර් 1 දිනට යොදා ගැනීමට බලාපොරොත්තු වන  බවට ය. විකල්පයක් ලෙස නොවැම්බර් 8 වැනි දින යොදා ගැනීමට ද යෝජනා වී ඇත.

මෙය පෙර නො වූ විරූය. ව්‍යවස්ථානුකූලව මහා මැතිවරනයට, 2010 මුල වන තෙක් කල් තිබේ. කම්කරු පක්ෂය තවමත් ගත කර ඇත්තේ වසර දෙක හමාරකට අඩු කාලයකි. එයට පාර්ලිමේන්තුව තුල කැපී පෙනෙන බහුතරයක් ද තිබේ.

මෙතරම් කලින් මැතිවරනයට යෑම මගින් විවිධ අංශවලින් බ්‍රවුන්ට අභිමිවීමට බොහෝ දේ තිබේ. ටෝනි බ්ලෙයාර්ගේ ඉවත්වීමෙන් පසුව ලේබර් පක්ෂයේ සහයෝගය යථා තත්වයට පත් වී නැත. අතුරු මැතිවරන ප්‍රතිඵල ඇඟවුම් කරන්නේ පුවත්පත් කර්තෘ මන්ඩලවල උද්දාමය ඡන්දදායකය තුල ප්‍රතිරාවය වී නැති බවයි. ඊට අමතරව, ඔහුගේ හදිසි මැතිවරනය අවස්ථාවාදී උපාමාරුවක් ලෙස පෙනී ගියහොත් බ්‍රවුන්ට එරෙහිව මහජන ප්‍රතිචාරයක් ඇති විය හැකියයි බොහෝ විචාරකයන් කනස්සල්ල පල කර තිබේ.

එවැන්නක ප්‍රතිඵලවල අන්තරායකාරී බව පිලිබඳව *ගාර්ඩියන්* හා *ඔබ්සර්වර්* පුවත්පත් දෙකම දැඩි ලෙස අනතුරු අඟවා ඇත. 96 දෙනෙකුගේ බහුතරයක් තිබිය දී මැතිවරනයක් කැඳවීම මගින් ලේබර් පක්ෂයේ හැරල්ඩ් විල්සන් "1970 දී කොතරම් නරක ලෙස වරද්දා ගත්තේ දැයි" මාර්ටින් කෙට්ල් සඳහන් කලේය. අවසාන ප්‍රතිඵලය වූයේ ටෝරීන්ගේ 30 ක බහුතරය කි. "විල්සන්ට මෙන් ම (කොන්සර්වේටිව් නායක) ටෙඩ් හීත්ට ද දැකගත හැකි වූයේ කලට පෙර මැතිවරන කැඳවූ අයට ඡන්දදායකයන් දඬුවම් කල අකාරයයි. යම් දුරකට 2007 මැතිවරනය, බ්‍රිතාන්‍ය ඉතිහාසයේ වඩාත් ම නොමේරූ එක වනු ඇතැ"යි ඔහු ලිවීය.

ලේබර් පක්ෂයේ මාධ්‍ය සහකරුවන්ගේ එවන් අනතුරු අඟවීම් බ්‍රවුන් විසින් නොතකා හරින්නේ නම් ඒ, 2008 මැයි දක්වා හෝ එසේ ප්‍රමාද කිරීම එයටත් වඩා බේදජනක වනු ඇයි ඔහුගේ උපදේශකයින් ගනන් බලන බැවින් ය.

අන් සියල්ලටත් වඩා හදිසි මැතිවරනයක් පැවැත්වීමේ දී, සැලකිල්ලට ගෙන ඇත්තේ ලෝක ආර්ථිකයේ තත්වයයි. නොදර්න් රොක් බැංකුවෙන් සිය මුදල් ආපසු ගැනීමට බ්‍රිතාන වීදිවල තැන්පත්කරුවන් පෝලිම් ගැසුනු තැන් පටන් යම්තම් සති කිහිපයක් ගත වී ඇත. එහි කඩා වැටීම හා සමස්ත බැංකු පද්ධතිය කරා එය පැතිරී යාම වැලකී ගියේ එක්සත් ජනපද මහ බැංකුව පොලී අනුපාතය අඩු කිරීමට තීරනය කිරීම මගින් හා එංගලන්ත බැංකුව පවුම් බිලියන 10ක් ලබා දීමට පොරොන්දු වීමෙනුත්

පමනි. කෙසේ වුව ද ජාත්‍යන්තර නය මිරිකී යෑමකට තුඩුදුන්, පතුලෙහි ඇති අර්බුදයට මෙයින් කිසිදු පිටුවහලක් නො වනු ඇත. හිටපු මහ බැංකු අධිපති ඇලන් ග්‍රීන්ස්පෑන් පුරෝකථනය කර ඇත්තේ ලෝක ආර්ථිකයේ පහලට නැඹුරුවීමක් විශේෂිතව බ්‍රිතානයට තදින් බලපානු ඇති බවටය. මන්ද යත් ලන්ඩන් නගරය ගෝලීයව නිරාවරනය වීමත්, රටේ නිවාස වෙලඳපොලට එහි බලපෑමත් හේතුකොට ගෙනය. පෞද්ගලික ආදායම මෙන් පස්ගුනයක් වූ උකස්කර වටිනාකම් හා ලාභ නය සම්පාදනයන් මඟින්, පසු ගිය වසරවල නිවාස මිල ගනන් තෙගුනයකින් ඉහල ගොස් ඇත. නයට දෙන මුදල් මත පාලනයක් හා පොලී අනුපාතයේ යම් ඉහල නැගීමක් විනාශකාරී වනු ඇත.

එක්සත් රාජධානියේ පාරිභෝගිකයන් දැනටමත් නය බරින් මිරිකී ඇත. බ්‍රිතානයේ මුලු දල දේශීය නිෂ්පාදිතය ඉක්මවා ගිය පවුම් ට්‍රිලියන 1.3ක් බ්‍රිතානයන් නය වී ඇත. පවුම් 10,000 කට වඩා නය ගැති එනම් සෑම පස්දෙනෙකුගෙන් එක් අයෙක් " බරපතල මූල්‍ය ගැටලුවලට මුහුන දෙති" මිලියන 2.3 න්දෙනා අතරින් එක් අයෙකුගේ නය බර පවුම් 30,000 කි. දැනට බ්‍රිතානයේ නය බරෙන් නිදහස් වන්නේ පාරිභෝගිකයන්ගෙන් හතරෙන් පංගුවකටත් වඩා අඩු සංඛ්‍යාවකි.

මනිගේට් යන මාර්ගගත නිවාස තැරුව්කරුවන් හා ස්ටෑන්ඩර්ඩ් හා පුවර්ස් යන නය තක්සේරුකාර ආයතනය මෙම සතියේ දී අනතුරු ඇඟවූයේ ලක්ෂ ගනනක් වන නිවාස ගැනුම්කරුවන් මෙතෙක් භුක්තිවිඳි ස්ථාවර උකස් අනුපාතික කාලපරිච්ඡේදය අවසන් වෙමින් සිය මාසික වාරික සියයට හැටකින් පමන ඉහල නැගීමක් දැක ගනු ඇති බවයි. පවුම් 125000ක ස්ථාවර අනුපාතික උකස්කරයක් ඇති අයෙක් ගෙවන මාසික වාරිකය පවුම් 600ක් හා සියයට 5.7ක් වන අතර එය පවුම් 750ක් දක්වා ඉහල යෑමක් අත්විඳිනු ඇත. ඔවුන් නය අවදානමක් බව සලකන විට එය පවුම් 960 ක් දක්වා වැඩි වනු ඇත. දැනටමත් මේ වසර තුල තුනෙන් එකකින් ඉහල ගොස් ඇති නිවාස, යලි අත්පත් කර ගැනීම් අහස උසට නඟිනු ඇත.

නය අර්බුදය දැනටමත් ව්‍යාපාර ආයෝජනයන් කෙරෙහි බලපා ඇති අතර ආර්ථික විද්‍යාඥයන් අනාවැකි පලකරන්නේ බ්‍රිතානයේ වාර්ෂික වර්ධන අනුපාතය එලඹෙන කාලවකවානුව තුල දී අඩකින් පහත වැටෙනු ඇති බවට ය. එය පොදු පිරිවැය කෙරෙහි ප්‍රමුඛ ඇඟවුම් ඇති කරයි.

ටයිම්ස් පත්‍රයේ ආර්ථික වාර්තාකරු ගැරී ඩන්කන් නිශ්චිතව සඳහන් කල පරිදි "ආර්ථිකය පිලිබඳ බලාපොරොත්තු වේගයෙන් පිරිහෙමින් තිබේ. 2008 සඳහා නම් දශකය ආරම්භයෙන් පසු රටේ දැකගත හැකි රුදුරුම වසර එය විය හැකිය. බ්‍රවුන් සම්බන්ධයෙන් ගත්විට අඳුරුවන දර්ශනය ඔහුට හැකි ඉක්මනින් මැතිවරනයකට යෑමේ දැඩිවන අභිප්‍රාය පෙන්නුම් කරනවා පමනි".

හදිසි මැතිවරනයකට යෑමේ හැකියාව පිලිබඳ සිදුවන ලේබර් පක්ෂයේ ගනන් බැලීම් උත්තේජනය කරන නරුමකම, බ්‍රවුන් මුහුන දෙන දෙවැනි ප්‍රධාන ප්‍රශ්නය වන, ආසන්න වෙමින් තිබෙන ඉරානයට එරෙහි යුද්ධය තුල ද ප්‍රකාශනයක් අත් කර ගනියි.

බස්රාහි බ්‍රවුන්ගේ රඟපෑම ද භට සංඛ්‍යාවන් අඩු කිරීමේ ඔහුගේ පොරොන්දුවල ද අර්ථය වන්නේ, ප්‍රකාශිතව ඇති ප්‍රජාතන්ත්‍රවාදී ආන්ඩුව වෙත ස්වෛරීභාවය පැවරීමේ කොටසක් ලෙස ඉරාකය සිය ආරක්ෂක හමුදාවන් පුහුනු කිරීමේ කටයුතුවල දී බ්‍රිතාන්‍ය සාර්ථකත්වයක් ලබා ඇති බවට කෙරෙන කියාපෑම ශක්තිමත් කිරීමය.

යථර්ථයේ දී නම් ඉරාකය තුල බ්‍රිතාන්‍ය මැදිහත්වීමේ කිසිදු අවසානයක් දක්නට නැත. අඩු ම තරමින් තවත් දෙවසරක් යන තෙක් බස්රා ගුවන්තොටුපලෙහි තුන්දහසක පමන හමුදාවක් රඳවා තැබෙනු ඇත. ආරක්ෂක ප්‍රධානීන් සැලසුම් කර ඇත්තේ 2011 වන තාක් හමුදාව රඳවා තැබීමටයි. බ්‍රවුන් යලි වතාවක් අවධාරනය කලේ ඕනෑ ම හමුදා ඉවත් කර ගැනීමක් බිම් මට්ටමේ තත්වය මත රඳා පවතින අතර අවශ්‍ය නම් වෙනස් කල හැකි බවයි.

වඩාත් වැදගත් වන්නේ, දැන් ඉරාකය තුල සිදුවන්නේ කුමක් ද යන්න, ටෙහෙරානයට එරෙහි මිලිටරි සතුරුකම්වලට අදාල බුෂ් පරිපාලනයේ සැලසුම් සමඟ එහි ඇති බැඳීමයි. බස්රා වෙතින් ඉවත් කර ගන්නා භට සංඛ්‍යාව කවරක් වුවත්, කුවේටය විය හැකි ගල්ෆ් රාජ්‍යයන්ගෙන් එකක් තුල, විශාල සංඛ්‍යාවක් යලි ස්ථානගත කරනු ඇත. එය, ඉරානයට එරෙහි යුද්ධයේ දී නියම ස්ථානගත කිරීමක් වනු ඇත. හෝමුස් සමුද්‍රසන්ධියෙහි බිම්බෝම්බ ඉවත් කරන නැව් බ්‍රිතානය විසින් දැනටමත් රඳවා තිබේ.

ඉරාන ආක්‍රමනයට පිටුබලය සැපයූ බ්‍රවුන් ඕනෑ ම එක්සත් ජනපද මිලිටරි ක්‍රියාවකට සහයෝගය දෙනු ඇති බව නිසැකය. *නිව් යෝකර්* සඟරාවේ සීමොර් හර්ෂ්ට අනුව බ්‍රවුන් දැනටමත් ඉරානයේ විප්ලවකාරී ආරක්ෂක භටකා මූලස්ථානයට පහර දීමේ වොෂින්ටන්හි සැලසුමට පිටුබලය දී තිබේ. එවන් ගුවන් ප්‍රහාර පුලුල් යුද්ධයක ආරම්භය පමනක් විය හැකිය. සීඅයිඒ හි හිටපු ත්‍රස්තවිරෝධී නිලධරයෙකු වූ ෆිලිප් ගිරාල්ඩි පැවසුවේ "න්‍යෂ්ටික නොවන හා උපායික න්‍යෂ්ටික අවි දෙවර්ගයම යොදාගෙන ඉරානයට පුලුල් පරිමානයේ ගුවන් ප්‍රහාර එල්ල කිරීම" සඳහා වූ සැලසුම් වොෂින්ටනය විසින් සකස් කර ඇති බවයි.

කාලයට පෙර මැතිවරනයක් ප්‍රකාශ කිරීම මඟින් බ්‍රවුන් බලාපොරොත්තු වන්නේ ඉදිරි දිනක දී පරාජය විය හැකි මැතිවරනයක් අන්තරාය මග හැරීම පමනක් නොව, පුලුල් වැඩ කරන ජනතා කොටස්වල අවශ්‍යතාවන්ට සතුරුවූ ප්‍රතිපත්ති සඳහා තමන්ට වරමක් ඇතැයි ප්‍රකශ කල හැකි ජයග්‍රහනයකි.

යථාර්ථයේ දී එවන් හදිසි මැතිවරනයක් එවන් ජනතා වරමක් සපයා නො දෙනු ඇත. එවන්නක් සිදුවනු ඇත්තේ ලේබර් පක්ෂය පමනක් නො ව වෙනත් කිසිදු පක්ෂයක් මැතිවරන ප්‍රකාශනයක් නිකුත් නො කල යුතු යටතේ හා අපේක්ෂකයන් ඉදිරිපත් කිරීම සඳහා කෙටි දැනුම් දීමකින් දැවැන්ත මුදල් සම්භාරයක් අවශ්‍ය කෙරෙන්නා වූ නියෝග මගින් කිසිදු සැලකිය යුතු සහභාගිත්වයක් කුඩා පක්ෂවලට අහිමි කිරීමේ කොන්දේසි යටතේය.

දවසේ ප්‍රධාන ප්‍රශ්න පිලිබඳව ඡන්දදායකයන්ගේ අදහස් විමසීමකට වඩා ටෝරීන් සමග අන්‍යෝන්‍ය එකඟතාවය මත කටයුතු කිරීමේ දී විදේශ පිලිවෙත පිලිබඳ සාකච්ඡා සිදු නො වන අතර ආර්ථික පහත වැටීමේ මුලු බර වැඩ කරන ජනතාව, මත පැටවීම සඳහා සැලසුම් කර ඇති පියවරයන් පිලිබඳව ටෝරීන් සමග කිසිදු මත භේදයක් ඇත්තේ නැත.

ප්‍රධාන පක්ෂ දෙකම මහා ව්‍යාපාරිකයේ හා වයඹදිග ආන්තිකව වැදගත් වන ආසන අතලොස්සක සංකේන්ද්‍රිත පටු ස්ථරයක් වන ඉසුරුමත් ඉහල මධ්‍යම පන්තියේ සහයෝගය ගොනු කර ගැනීමට අපේක්ෂා කරයි.

අගමැති බවට පත්වීමේ තැන් පටන් බ්‍රවුන්ගේ සෑම ප්‍රකාශයක් ම කැටි කර දක්වා ඇත්තේ අවමංගත වූ ටෝරීන් වෙත කරන ආයාචනයක් ලෙසිනි. ඔහු ගෙන යන ව්‍යාපාරය පසු ගිය මාසයේ අරඹනු ලැබුවේ අංක 10 (අගමැති නිල නිවසේ) පැවති තේ පැන් සාදයකට මාගරට් තැචර් වෙත කල අරාධනයක් සමඟිනි. එහි දී ඇය හුවා දක්වනු ලැබුවේ තමා මෙන් ම "පරිනත දේශපාලඥයෙක්" වශයෙනි. ඉන් පසුව පැවති ලේබර් පක්ෂ සමුලුවේ දී, ටෝරීන්ගේ ප්‍රතිපත්ති සෑම එකක් ම මුලුමනින් ම පාහේ සොරා ගත් ඔහුගේ කථාව, තැචර්ගේ "ස්වභාවික උරුමක්කාරයා" ලෙස බ්‍රවුන්ට විරුදාවලියක් ලැබුනේ අන් කිසිවකුගෙන් නො ව නෝමන් ටෙබිට් (කොන්සවේටිව් නායක) ගෙන් මය.

මෙය, ආන්ඩුවට ප්‍රමුඛ ව්‍යාපාරිකයන්, ලිබරලුන් හා බොහෝ ටෝරීන් බඳවා ගෙන ඇති බ්‍රවුන්ගේ " මහා කුඩාරම" නම් මූලෝපායේ කොටසකි. පටු පක්ෂ දේශපාලනයට ඉහලින් නැගී සිටින, බ්‍රිතානයේ ජාතික අවශ්‍යතාවන් ඉදිරියට ගෙනයන අන්තර්ගතයක් වෙනුවෙන් කැපවූවක් ලෙස මෙය රූගත කල ද එහි සැබෑ අරමුන වන්නේ ලේබර් පක්ෂය හරහා ක්‍රියාවට නැංවූ මහා ව්‍යාපාරිකයේ දේශපාලන ඒකාධිකාරය තහවුරු කර ගැනීමයි.

බ්‍රවුන්ගේ මහා කුඩාරමෙන් තරයේ ම බැහැර කොට ඇති ජන කොටස වන්නේ කම්කරු පන්තිය යි. ඔහු පැන වූ රාජ්‍ය අංශයේ වැටුප් කැටි කිරීමට එරෙහිව වැඩ වර්ජනය කල කම්කරුවන් හෙලා දුටු බ්‍රවුන් අවධාරනය කලේ "ආර්ථික ස්ථාවරත්වය පවත්වා ගැනීමේ අත්‍යවශ්‍ය කොටසක් වන්නේ" "විනයගත" වැටුප් ප්‍රදානයන් ය. "එය අනතුරට හෙලීමේ කිසිදෙයක් - කිසිදෙයක් - අප නො කරනු ඇත" යනු වෙනි.

ඔක්තෝබර් 8 දින පාර්ලිමේන්තුව යලි රැස්කිරීමට සමගාමීව යුද්ධය නතර කරනු සභාගය කැඳවූ පෙලපාලිය නාගරික පොලිසිය විසින් තහනම් කරනු ලැබූ බව මේ සතියේ නිවේදනය කෙරුනි.

එතරම් කෙටි දැනුම් දීමකින් මැතිවරනයක් කැඳවීමේ ඇඟවුම පිලිබඳව ආන්ඩුවේ අනුත්සුක භාවය මගින්, ප්‍රජාතන්ත්‍රීය අයිතීන් කෙරෙහි ලේබර් පක්ෂයේ සතුරු ආකල්පය යලිත් සනාථ කෙරේ. මිලියනයක් තරම් ඡන්දදායකයන්ට ඡන්ද අයිතිය අහිමි විය හැකිය. ඊට හේතුව දෙසැම්බර් 1 දින තෙක් සම්පූර්න නො කෙරෙන 2007 ඡන්දදායක ලැයිස්තුවල ඔවුන්ට ලියාපදිංචි නො විය හැකි වීමය.

ඔවුන් විසින් සැඟවීමට උත්සාහ කරන අත්‍යවශ්‍ය දේශපාලන ප්‍රශ්න පිල්බඳව කම්කරු ජනතාව, සිසුන් හා තරුනයන් දැනුවත් කිරීම සඳහා සමාජවාදී සමානතා පක්ෂය මහා මැතිවරන ව්‍යාපාරය තුල මැදිහත් වනු ඇත.

අපගේ උද්ඝෝෂනයෙහි මූලික යොමුව වනු ඇත්තේ ව්‍යාපාරික පැලැන්තියේ දේශපාලන උපකරනයක් ලෙස සේවය කරන "කම්කරු" ආන්ඩුවක් විසින් මිලියන ගනනක් වැඩ කරන ජනතාවගේ ඡන්ද අයිතිය උදුරා ගෙන ඇති තත්වය තුල අව්‍යාජ හා නව සමාජවාදී පක්ෂයක් ගොඩනැගීමේ අවශ්‍යතාවය අවධාරනය කිරීමය. රැකියාවලට, ජීවන තත්වයන්ට, ප්‍රජාතන්ත්‍රීය අයිතීන්ට එරෙහිව කෙරීගෙන යන ප්‍රහාරය ද යුද්ධයේ උත්සන්න වන තර්ජනය ද සමග සටන්වැදිය හැක්කේ මෙම මාර්ගයෙන් පමනි.

© www.wsws.org